www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගාසා තීරයේ අර්බුදය හා නොනවතින විප්ලවයේ ඉදිරිදර්ශනය

## The Gaza crisis and the permanent revolution

**2008 දෙසැම්බර් 30**

මැද පෙරදිග පුරා ද ලොව වටා ද මහජන කෝපය අවුලුවාලූ ගාසාවට එරෙහි බිහිසුනු ප්‍රහාරය මධ්‍යයේ, අරාබි ලෝකයේ පමනක් නොව වෙනත් තැන්වල ද ආන්ඩු මෙම එක්සත් ජනපද හා ඊශ්‍රායල් යුද අපරාධයට යුක්ති යුක්තභාවය සැපයීම සඳහා පෙල ගැසී සිටිති.

අවහිර කොට ඇති බිම් තීරුවක සිර බන්ධන ගතකොට සිටින බෙහෙවින්ම අනාරක්ෂිත හා අඩ නිරාහාර මිලියන එක හමාරක ජනතාවට එරෙහිව ඊශ්‍රායලය ප්‍රකාශයට පත්කොට ඇති ''අතොරක් නැති යුද්ධය'' විය යුතු පරිදි ම දල්වා ඇත්තේ කෝපය හා පිලිකුලයි. එසේම ජනමාධ්‍ය ද, ආක්‍රමනිකයා ආක්‍රමනයට ගොදුරුවූවන්ට ද, එක්සත් ජනපදයෙන් සම්පාදිත එෆ් 16 ප්‍රහාරක ගුවන් යානා, අපායේ මිසයිල හා (ලේසර් කිරන මඟින් ඉලක්කය සොයා ගන්නා) ''ස්මාට් බෝම්බ'' අතින් සෑදූ රොකට් වලට ද සමාන කරමින් පලකරන අතොරක් නැති කුහක හා ව්‍යාජ වාර්තාවලින්, තට්ටු නිවාස, පොලිස් මධ්‍යස්ථාන, විශ්ව විද්‍යාල, පල්లි හා කාර්යාල ගොඩනැගිලි වලට එල්ල කරන ඊශ්‍රායල් ගුවන් ප්‍රහාර, ''ආත්මාරක්ෂාවේ''ක්‍රියාවක් ලෙස විස්තර කරති.

එසේද වුවත් ඊශ්‍රායලය කෙරෙහි පලවන සදාචාරාත්මක කෝපය හා හෙලාදැකීම්, ගාසාවේ අපරාධ වලට කිසිලෙසකින් හෝ සැලකිය යුතු පිලිතුරක් නොවේ. සියල්ලටමත් වඩා අවශ්‍ය වන්නේ දේශපාලන ඉදිරි දර්ශනයකි.

දැන් ප්‍රහාරයට ලක්ව සිටින බොහෝ දෙනා, ඊශ්‍රායලය 1967 දී සිය ව්‍යාප්තවාදී යුද්ධය මඟින් ප්‍රචන්ඩත්වයට හා සිය නිවෙස් වලින් පලවා හැරීමට ලක්කල සරනාගතයන්ගේ දරුවන්ය. දැන් මෙන්ම එකල ද, පලස්තීනුවන්ගේ ඛේදනීය තත්වය ලෝකයේ ආන්ඩු විසින් නොතකා හල අතර ඔවුන් වෙනුවෙන් පෙනී සිටින බව කියාසිටි ධනපති අරාබි ජාතිකවාදී තන්ත්‍රයන් විසින් ඔවුන්ගේ අවශ්‍යතාවන් පාවාදෙනු ලැබුනි.

පසුගිය තෙදින තිස්සේ ගාසාව තුල මෙම බිහිසුනු සිදුවීම් දිග හැරෙමින් තිබියදී අද දිනයේ අරාබි ජාතිකවාදී ආන්ඩු එක්කෝ පලස්තීනුවන්ට එරෙහි ප්‍රහාරයේ සෘජු හවුල්කරුවන් ලෙස හෝ නිහඬව ඊට ඔවුන්ගේ දේශපාලන සහාය පලකිරීමේ යෙදී සිටිති.

වඩාත්ම සාපරාධී ක්‍රියාකලාපය ඉටුකරනු ලබන්නේ එක්සත් ජනපදයේ පිටුබලය ලබන ඊජිප්තුවේ පොලිස් රාජ්‍යයෙහි හොස්නි මුබාරක් තන්ත්‍රය විසිනි. ගාසාවට දඬුවම් කිරීමෙහිලා ඊශ්‍රායලය පනවා ඇති ආර්ථික අවහිරකිරීමට සහාය දෙමින් සඳහා ඊජිප්තුව එරට හා ඊශ්‍රායලය අතර රාෆා මං කපොල්ල වසා දැමීමට කටයුතු කලේය. බෝම්බ හෙලීම ඇරඹීමෙන් පසුව ඊජිප්තු දේශසීමාව හරහා ආරක්ෂාව පතා පලායාමට උත්සාහ කල පලස්තීනුවන්ට මුහුනපෑමට සිදුවූයේ ඊජිප්තුවේ මැඹින් තුවක්කු ප්‍රහාරයන්ට ය.

බෝම්බ දැමීමට පැය ගනනකට පෙර ප්‍රහාරයක් දියත් කිරීමට ඊශ්‍රායලයේ අදහසක් නැතැයි සහතික වෙමින් කයිරෝ තන්ත්‍රය ගාසාවේ හමාස් නායකත්වය හිතාමතාම රැවටූ බවට පුලුල් සැකයක් පවතියි. ඊජිප්තුවේ මෙම සහතිකය ගොඩනැගිලිවලින් මිනිසුන් ඉවත් නොකිරීමට හේතුවූ බවත් එහි ප්‍රතිපලය වශයෙන් මරන හා අංග විකලවීම් ඉහල නැඟ ඇති බවත් හමාස් නියෝජිතයන් අවධාරනයෙන් සඳහන් කරති.

අරාබි තානාපති ආරංචි මාර්ග උපුටා දක්වමින් අරාබි බසින් ලංඩනයේ පලකෙරෙන අල් කුඩ්ස් අල් ඇරබි පුවත්පත වාර්තා කරන්නේ ඊජිප්තු බුද්ධි අංශයේ ඇමති ඔමාර් සුලීමාන් ඊශ්‍රායලය ගාසාවට එරෙහිව එවන් ප්‍රහාරයකට සූදානම් වෙමින් සිටින බවට අරාබි නායකයන් ගනනාවකට අනතුරු ඇඟවූ බවය.

ඊජිප්තු විදේශ ඇමති ආමඩ් අබුල් ගයිට් 27 වන දින පැවති මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කලේ ගාසාවේ ප්‍රචන්ඩත්වය සඳහා හමාස් සංවිධානය වගකිවයුතු බවයි. ''ඊජිප්තුව දිගුකලක් අනතුරු අඟවා තිබියදීත් එම අනතුරු ඇඟවීම් නොතකා හල අය මේ ප්‍රතිවිපාක සඳහා වගකිවයුතු යයි'' ඔහු පැවසීය.

සවුදි රජ පවුලට සමීප පුවත්පත් ඊශ්‍රායල් ප්‍රහාරය නොවලහා පිලිගත්තේ එය මැද පෙරදිග ''ඉරාන ඒජන්තයන්ට'' එල්ලකල ප්‍රහාරයක් ලෙස විස්තර කරමිනි.

එසේම ජනාධිපති මොහමඩ් අබ්බාස්ගේ නායකත්වයෙන් යුත් රමල්ලාහි පලස්තීනු අධිකාරයේ නියෝජිතයන් ඊශ්‍රායල් මාධ්‍ය වෙත ප්‍රකාශකර ඇත්තේ ගාසාහි ජන සංහාරය එහි බලය අල්ලාගැනීම සඳහා

අවස්ථාවක් ලෙස ඔවුන්ට පෙනීයන බවයි. ඊශ්‍රායලය අවි බලයෙන් හමාස් පාලනය පෙරලා දැමීමට සමත් වන්නේ නම් තමන් එහි පැමිනීමට සූදානම් බව ඔවුන් සියොන්වාදී සංස්ථාපිතයට සහතික වෙමින් කියා සිටියේය.

මෙම ප්‍රහාරයන් නිල වශයෙන් හෙලාදුටු හා අනෙකුත් අරාබි ආන්ඩු ප්‍රහාරයේ හවුල්කරුවන් වීම පිලිබඳව ඔවුන් විවේචනය කල ඉරානය හා ලිබියාව වැනි තන්ත්‍රයන් පවා එසේ කලේ ඔවුන්ගේම කලාපීය හා ධනේශ්වර දේශපාලන අවශ්‍යතාවන් පෙරට ගෙනයාමේ දෘෂ්ටී ආස්ථානයක සිටය.

සමස්තයක් ලෙස අරාබි තන්ත්‍රයන්ගේ ප්‍රතිචාරය පිලිබඳ මනා සංකේතයක් නම් අරාබි සංගමයේ විදේශ ඇමතිවරුන්ගේ ''හදිසි රැස්වීමක්'' 31 වන දින තෙක් කල් දැමීමයි. මෙමඟින් ඊශ්‍රායලයට තවත් සෙවල ප්‍රකාශයක් සමඟ පොරබැදීමට පෙර බෝම්බ දැමීම සඳහා සම්පූර්න දින පහක් ලැබී තිබේ.

සිවිල් ජනතාවකට එරෙහිව දැවැන්ත රාජ්‍ය ත්‍රස්තය යොදාගන්නා අය විසින්ම සිදුකරමින් ඇති හමාස් සංවිධානයේ නායකයන් ඝාතනයකිරීම් හා එහි ආධාරකරුවන් ''ත්‍රස්තවාදීන්'' ලෙස හංවඩු ගැසීමට එරෙහිව එය ආරක්ෂා කිරීම අවශ්‍ය වනවා සේම මෙම ඉස්ලාම්වාදී ව්‍යාපාරයට එක්සත් ජනපද-ඊශ්‍රායල් ආක්‍රමනයට මුහුනදීමට හා එය පරාජය කිරීමට ශක්‍ය ඉදිරි දර්ශනයක් ඇත්තේ ද නැති බව අවධරනය කිරීම ද අවශ්‍ය ය.

ආර්ථික සම්බාධක ඉවත්කරලීම සඳහා ඊශ්‍රායලය ඒත්තුගන්වා ගැනීම අරමුනු කර ගෙන දකුනු ඊශ්‍රායලයට රොකට් එල්ලකිරීම, ඊශ්‍රායලය තුල අවන්හල් හා බස් රථ තුල පුපුරවාගැනීම සඳහා තරුන පලස්තීනුවන් පිටත්කර හැරීමේ ''දිවි පුදකිරීමේ මෙහෙයුම්'' පිලිබඳ එහි නවතම කතන්තර මෙන්ම, සියොන්වාදී තන්ත්‍රයට බලපෑම් දැමීම සඳහා සමානව සැලසුම් කල ඒවාය.

අරාබි රටවල් තුල ජාතිකවාදයේ හා ඉස්ලාම්වාදයේ ආධිපත්‍යයෙන් සියොන්වාදී තන්ත්‍රයට තරම් වෙන කවරෙකුටවත් වාසි සැලසෙන්නේ නැත. වර්තමාන මඩ ගොහොරුවෙන් පිටතට කිසිදු ජාතික මාවතක් ඇත්තේ ද නැත.

කලාපය තුල තවත් අල්ප ජාතික රාජ්‍යයක් නිර්මානය කිරීමෙන් දශක ගනනාවක් පැරනි පලස්තීනුවන්ගෙන් පැහැර ගැනීමට විසඳුමක් සම්පාදනය නොකරනු ඇත. ඊශ්‍රායල් ජනාවාස, රැකවල් ලූ මාර්ග, මුර කපොලු හා තාප්ප මඟින් බටහිර ඉවුර හා ගාසාව වෙන්කිරීම, එවන් භූමිභාගයකට පැවතිය හැක්කේ පලස්තීන ධනේශ්වර ජාතිකවාදී තන්ත්‍රය මුරකරුවන් ලෙස කටයුතු කරන බන්ටුස්ටාන් වර්ගයේ සිරගෙයක් ලෙස පමනක් බව මනාව පැහැදිලි කරයි.

දැවැන්ත ජනවාර්ගික පවිත්‍රකරනයක් බවට පත්වන, ඊශ්‍රායලය තුලම ජීවත්වන මිලියනයක අරාබි ජනගහනය පලවාහැරීම සඳහා දේශපාලන පදනම සකසා ගැනීම පිනිස ''රාජ්‍ය-දෙකේ විසඳුම'' ලෙස නම් කල එවන් යෝධ විකෘතියක් නිර්මානය කිරීමේ මාධ්‍යයන් ලෙස පමනක් ඊනියා ''සාම ක්‍රියාවලිය'' තමන්ට පෙනී යන බව ඊශ්‍රායල් නිලධාරීන් පැහැදිලි ලෙසම ප්‍රකාශ කර තිබේ.

ගාසාවට පහර දීම මෙන්ම මෙම උමතු ඉදිරි දර්ශනය ද සියොන්වාදයේ දේශපාලන බංකොලොත්කම හා අර්බුදයේ ප්‍රකාශනයකි. ඊශ්‍රායල් රාජ්‍ය හා එහි සියලු ප්‍රධාන පක්ෂ මිලිටරි සංස්ථාපිතයට යටත්ව සිටිති. පාලන තන්ත්‍රය සිවිල් ජනතාව මත විනාශය කටින අතර ඊශ්‍රායලයේ ම ජනතාවගෙන් විශාල කොටස් භීතියට හා ඉච්ඡාභංගත්වයට පත්කරන මංමුලාසහගත එක් මිලිටරි මදාවියක සිට තවෙකකට පනියි - ලෙබනනයේ සිට ගාසාවට, ක්ෂිතිජය මත ඇත්තේ ඉරානයයි-

නිරන්තරව අවුලුවාලන භීතිය හා ස්වෝත්තමවාදය මඟින් ආන්ඩුව එහි බලය පවත්වාගැනීමට උත්සුක වන අතර දිගහැරෙන ප්‍රචන්ඩත්වය දෙස පිලිකුලෙන් බලන හා එය තුඩුදිය හැක්කේ තව තවත් ව්‍යසනයන්ට පමනක් යයි ඒත්තුගෙන සිටින බොහෝ ඊශ්‍රායල් වරුන් ද සිටියි.

අවසාන වශයෙන් ඊශ්‍රායල් රාජ්‍යයේ ආක්‍රමනකාරී මිලිටරිවාදය හුදෙක් සියොන්වාදී දෘෂ්ටිවාදයේ පමනක් නොව ඊශ්‍රායල් සමාජය හරහා ගමන්කරන ගැඹුරට විහිද යන සමාජ දේශපාලන හා පන්ති බෙදීම්වල ද ප්‍රකාශනයකි. එය පුලුල් සමාජ අසමානතාවය මඟින් අංගලක්ෂිතව ඇති සමාජයක් මෙන්ම සමස්ත සියොන්වාදී සංස්ථාපිතයේම ජරපත්වීම ප්‍රකාශයට පත්කරන මූල්‍ය හා දේශපාලන දූෂන පිලිබඳ සාපරාධී චෝදනාවෙන් යාන්තමින් බේරුනු අගමැති ඒහුඩ් ඔල්මර්ට් නමැති පුද්ගලයා විසින් මෙහෙයවන තන්ත්‍රයක් ද වේ.

ගාසාවට එල්ලකල බෝම්බ ප්‍රහාරයේ ප්‍රථම වටයත් සමඟ පැවැත්වූ ආන්ඩුවේ රැස්වීමෙන් පසුව ඔල්මර්ට්ගේ ප්‍රකාශක මාක් රිගෙව් ගේ විනිවිද පෙනෙන ප්‍රකාශයක් තුල මෙසේ සඳහන් විය. ''මෙතෙක් කල් බලා සිටීමෙන් පසුව අවසානයේදී අප ක්‍රියාත්මක වී ඇතැයි යන හැඟීමකින් යුත් ශක්තියක් අද කැබිනට් මන්ඩල කාමරය තුල පැවතුනි.'' ගුවන් ප්‍රහාර උපයෝගීකොට ගෙන අහිංසකයන් ඝාතනය කිරීම තිරිහන් වූ දේශපාලන ''ශක්තියක්'' පිලිබඳ මූලාශ්‍රයක් බව සලකීම තුලින් මෙම තන්ත්‍රයේ ස්වභාවය ගැන වෙලුම් ගනනාවක් දේ ප්‍රකාශ කරයි.

අරාබි හා යුදෙව් කම්කරුවන් ඔවුන්ගේ පොදු පන්ති අවශ්‍යතාවන්ගේ පදනම මත ඒකාබද්ධ කරන, ජාතික

දේශසීමාවන් ඉක්මවා යන පන්ති අරගලයේ පදනමක් මත පමනක් සියොන්වාදයට එරෙහි අව්‍යාජ අරගලයක් පිලිසිඳ ගත හැකිය. අරාබි හා ඊශ්‍රායල් කම්කරවන් දෙකොට්ඨාශම ස්වාධීනව හා එක්සත් ව බලමුලුගැන්වීම පිලිබඳ උත්සුකයක් සහිත පන්ති ඉදිරි දර්ශනයකින් පිටස්තරව මැද පෙරදිග සියොන්වාදයට හා අධිරාජ්‍යවාදයට මරු පහරක් එල්ල කිරීම පිලිබඳ කථාවල සැබෑ අර්ථයක් තිබිය නොහැකි ය.

ගාසාවට සහාය දක්වමින් කයිරෝවේ සිට මැද පෙරදිග දක්වා පැන නැඟී ඇති පෙලපාලි යොමුවන්නේ හුදෙක් ඊශ්‍රායලයට එරෙහිව පමනක් නොව ඊශ්‍රායලයේ වඩාත්ම විශ්වාසවන්ත කුනුවූ අරාබි තන්ත්‍රයන්ට එරෙහිවත් ය. මෙම මහජන ව්‍යාපාරය මෑතම සිද්ධීන්ට එරෙහි ප්‍රතිචාරයක් පමනක් නොව ලෝක ධනවාදයේ මංමුලාසහගත අර්බුදය මඟින් මැද පෙරදිග මෙන්ම යුරෝපයේ, ඇමරිකාවේ හා පෘතුවි ගෝලය පුරාම පෙරමුනට ගෙන එන කම්කරු පන්තියේ වැඩෙන පෙරලිකාරිත්වයක කොටසකි.

ගාසාව තුල එෆ් 16 ප්‍රහාරක යානා හා ඇපචි හෙලිකොප්ටර් වලට මුහුන දෙන පලස්තීනුවන්ගේ සියලු වීරත්වය හමුවේ වුව ද සියොන්වාදී තන්ත්‍රයට දැවැන්තම තර්ජනය හා එහි මාරක දුබලකම වන්නේ පන්ති අරගලයේ උත්සන්නවීම හා ඊජිප්තුවේ ද, අනෙකුත් අරාබි රාජ්‍යයන්ගේ හා ඊශ්‍රායලයේමත් සමාජවාදී විප්ලවය පිලිබඳ ශක්‍යතාවයි.

අව්‍යාජ විප්ලවවාදී විකල්පයක් නගා සිටුවිය හැක්කේ ලියොන් ට්‍රොට්ස්කි විසින් වර්ධනය කරන ලද පරිදි නොනවතින විප්ලවයේ න්‍යායික පදනම මත පමනකි. ට්‍රොට්ස්කි තහවුරු කල පරිදි අධිරාජ්‍යවාදී යුගය තුල පීඩිත ජාතීන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රීය හා ජාතික කර්තව්‍යයන් සාක්ෂාත් කල හැකි වන්නේ - ධනේශ්වරය නැඟී ආ පූර්ව විප්ලවවාදී කාල පරිච්ඡේදය සමඟ බැඳී තිබුනු කර්තව්‍යයන් - සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක් මත ක්‍රියාත්මක වන කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන බලමුලුගැන්වීමක් මඟින් පමනකි.

අවසාන විග්‍රහයේදී කලාපයේ කටුක ගැටුම් හා දේශපාලන බෙදවාචකයන්ගේ මධ්‍යස්ථානය වන පලස්තීන ප්‍රශ්නය, මැද පෙරදිග හා ජාත්‍යන්තරව සමාජවාදී විප්ලවයේ ඉරනම සමඟ අවියෝජනීය ලෙස බැඳී ඇත. ගාසාහි දිගහැරෙමින් ඇති සිද්ධීන් ඉමහත් හදිසි භාවයකින් ඉස්මතු කරන්නේ ධනවාදයට ලෝක පරිමානව අවසන් තිත තබන අරගලයේ කොටසක් ලෙස මැද පෙරදිග සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන තුල අරාබි මෙන්ම යුදෙව් කම්කරු පන්තියේ එකමුතුව සඳහා අරගලයයි.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org